ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
**University of Sri Jayewardenepura**

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
**External Degrees and Extension Courses Unit**

# විශේෂ නිවේදනයයි

## 2014 අධ්‍යයන වර්ෂය සඳහා වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවට (නව නිර්දේශය) ලියාපදිංචි වූ සිසුන්ගේ ලියාපදිංචි කාලය අවසන් කිරීම

විශ්වවිද්‍යාලයේ පවත්නා නීති රෙගුලාසි අනුව 2014 අධ්‍යයන වර්ෂයට වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සඳහා පළමු ලියාපදිංචිය වසර 03 ක කාලයක් දක්වා වලංගු වන අතර ඉතිරි වසර 04 ක කාලය සඳහා ලියාපදිංචිය දීර්ඝ කිරීම සිදු කල යුතු වේ.

ඒ අනුව 2014 අධ්‍යයන වර්ෂයට ලියාපදිංචි වූ සිසුන්ගේ ප්‍රථම ලියාපදිංචි වලංගු කාල සීමාව 2014/09/01 දින සිට 2017/08/31 දිනෙන් අවසන් විය. ඉතිරි වසර 04 ක් සඳහා වන ලියාපදිංචිය දීර්ඝ කිරීමට අදාල වලංගු කාල සීමාව 2017/09/01 සිට 2021/08/31 දිනෙන් අවසන් වේ. පවත්නා නීති රීතිවලට අනුව සෑම ලියාපදිංචිය දීර්ඝ කරන ලද වර්ෂයක් සඳහාම උපාධි I, II සහ III පරීක්ෂණ එක බැගින් පවත්වා ඇති අතර 2014 අධ්‍යයන වර්ෂයට ලියාපදිංචි වූ සිසුන්ගේ සිව්වන ලියාපදිංචිය දීර්ඝ කිරීම යටතේ උපාධි III පරීක්ෂණයක් පමණක් පැවැත්වීමට ඉතිරිව ඇත. සිව්වන ලියාපදිංචිය දීර්ඝ කිරීමට අදාලව උපාධි I කොටසේ පරීක්ෂණ පවත්වා අවසන් කර ඇති අතර උපාධි II කොටසෙහි පරීක්ෂණ 2022 අගෝස්තු/ සැප්තැම්බර් පැවැත්වේ.

ඒ අනුව 2014 අධ්‍යයන වර්ෂයට අදාල වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි III පරීක්ෂණය සඳහා 2023 ජනවාරි/පෙබරවාරි කාලසීමාව තුලදී අයදුම්පත් කැඳවන අතර එම අයදුම්පත් www.external.sjp.ac.lk යන අප වෙබ් අඩවියට පිවිස ලබා ගත හැක. ඉන් පසු කිසිදු පරීක්ෂණයක් සඳහා පෙනී සිටීමට 2014 අධ්‍යයන වර්ෂයේ ලියාපදිංචි වූ කිසිඳු සිසුවෙකුට අවස්ථාවක් නොමැති අතර එම උපාධි III පරීක්ෂණයෙන් පසු 2014 අධ්‍යයන වර්ෂයට අදාල වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව අවසන් වන බව කාරුණිකව දන්වා සිටිමි.

සහකාර ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
2022/08/30

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**
**University of Sri Jayewardenepura**

**බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය**
**External Degrees and Extension Courses Unit**

---

# විශේෂ නිවේදනයයි

## 2014 අධ්‍යයන වර්ෂය සඳහා වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවට (නව නිර්දේශය) ලියාපදිංචි වූ සිසුන්ගේ ලියාපදිංචි කාලය අවසන් කිරීම - සංශෝධිත නිවේදනය

බාහිර උපාධි පරීක්ෂණ සහ ලියාපදිංචිය සම්බන්ධව වන නීති රෙගුලාසි 55 වැනි බාහිර උපාධි කළමනාකරණ කමිටුව විසින් සංශෝධනය කරන ලදී.

**ඒ අනුව "2014 අධ්‍යයන වර්ෂය සඳහා වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවට (නව නිර්දේශය) ලියාපදිංචි වූ සිසුන්ගේ ලියාපදිංචි කාලය අවසන් කිරීම" යන ශීර්ෂය යටතේ 2022/09/04 දින පුවත්පත් දැන්වීම් මගින් ප්‍රසිද්ධ කරන ලද නිවේදනය පහත පරිදි සංශෝධනය විය යුතු බව කරුණාවෙන් සළකන්න.**

2014 අධ්‍යයන වර්ෂයට වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සඳහා පළමු ලියාපදිංචිය වසර 03 ක කාලයක් දක්වා වලංගු වන අතර ඉතිරි වසර 04 ක කාලය සඳහා ලියාපදිංචිය දීර්ඝ කිරීම සිදු කල යුතු වේ. ඒ අනුව මුළු අධ්‍යයන වර්ෂ කාලය අධ්‍යයන වර්ෂ 07 කි. 2014 අධ්‍යයන වර්ෂයට ලියාපදිංචි වූ සිසුන්ගේ ප්‍රථම ලියාපදිංචි වලංගු කාල සීමාව 2014/09/01 දින සිට 2017/08/31 දිනෙන් අවසන් විය. ඉතිරි වසර 04 ක් සඳහා වන ලියාපදිංචිය දීර්ඝ කිරීමට අදාල වලංගු කාල සීමාව 2017/09/01 සිට 2021/08/31 දිනෙන් අවසන් වේ. පරීක්ෂණ සහ ලියාපදිංචි කිරීම් සම්බන්ධව සංශෝධනය කළ නීති රීතිවලට අනුව මෙම වසර 7 ක කාලසීමාව තුල උපාධි I පරීක්ෂණ 07 ක්, උපාධි II පරීක්ෂණ 06 ක් සහ උපාධි III පරීක්ෂණ 05 ක් පැවැත්විය යුතු වේ.

<u>2014 අධ්‍යයන වර්ෂයට ලියාපදිංචි වූ සිසුන්ට පහත පරිදි පරීක්ෂණ පවත්වා ඇත</u>

| | ලියාපදිංචි කාලය | පවත්වා ඇති පරීක්ෂණ ගණන | | |
|---|---|---|---|---|
| | | උපාධි I | උපාධි II | උපාධි III |
| ප්‍රථම ලියාපදිංචිය (වසර 03) | 2014.09.01 - 2017.08.31 | 02 | 01 | 01 |
| ලියාපදිංචිය දීර්ඝ කිරීම (පළමුවර) | 2017.09.01 - 2018.08.31 | 01 | 01 | 01 |
| ලියාපදිංචිය දීර්ඝ කිරීම (දෙවනවර) | 2018.09.01 - 2019.08.31 | 01 | 01 | 01 |
| ලියාපදිංචිය දීර්ඝ කිරීම (තෙවනවර) | 2019.09.01 - 2020.08.31 | 01 | 01 | 01 |
| ලියාපදිංචිය දීර්ඝ කිරීම (සිව්වනවර) | 2020.09.01 – 2021.08.31 | 01 | 01 | * |
| | | **06** | **05** | **04** |

මේ වන විට 2014 අධ්‍යයන වර්ෂයට ලියාපදිංචි වූ සිසුන්ට ඉහත වගුවෙහි දක්වා ඇති පරිදි උපාධි I පරීක්ෂණ 06 ක්, උපාධි II පරීක්ෂණ 05 ක් සහ උපාධි III පරීක්ෂණ 04 ක් පවත්වා අවසන් ය. ඒ අනුව 2014 අධ්‍යයන වර්ෂයට ලියාපදිංචි වූ සිසුන්ට උපාධි I පරීක්ෂණ 01 ක්, උපාධි II පරීක්ෂණ 01 ක් සහ උපාධි III පරීක්ෂණ 01 ක් පවත්වනු ලැබේ. සිව්වනවර ලියාපදිංචිය දීර්ඝ කර ඇත්නම් උපාධි I, උපාධි II සහ උපාධි III පරීක්ෂණ සඳහා පෙනී සිටිය හැකිය. සිව්වනවර ලියාපදිංචිය දීර්ඝ කරන ලද සිසුන් නැවත ලියාපදිංචි දීර්ඝ කිරීමේ ගාස්තු ගෙවීම අවශ්‍ය නොවේ.

ඒ අනුව 2014 අධ්‍යයන වර්ෂයට අදාල අවසාන ලියාපදිංචිය දීර්ඝ කිරීම යටතේ (එනම් 2020/09/01 සිට 2021/08/31 දක්වා කාලසීමාව) පවත්වන වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි I පරීක්ෂණය සඳහා 2022/12/05 දින දක්වා අයදුම් කළ හැකිය. උපාධි II සහ III පරීක්ෂණ සඳහා 2023 ජනවාරි/පෙබරවාරි කාලසීමාව තුලදී අයදුම්පත් කැඳවන අතර එම අයදුම්පත් www.external.sjp.ac.lk යන අප වෙබ් අඩවියට පිවිස ලබා ගත හැක. ඉහත සංශෝධිත නීති රෙගුලාසි අනුව උපාධි I කොටස සඳහා පරීක්ෂණ 07 ක්, උපාධි II කොටස සඳහා පරීක්ෂණ 06 ක් සහ උපාධි III කොටස සඳහා පරීක්ෂණ 05 ක් පවත්වා අවසන් වූ පසු කිසිදු පරීක්ෂණයක් සඳහා පෙනී සිටීමට 2014 අධ්‍යයන වර්ෂයේ ලියාපදිංචි වූ කිසිඳු සිසුවෙකුට අවස්ථාවක් නොමැති අතර ඉන් පසු 2014 අධ්‍යයන වර්ෂයට අදාල වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරිමට ලබාදුන් කාලය අවසන් වන බව කාරුණිකව දන්වා සිටිමි.



සහකාර ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
2022/11/22